# පිය ගුණ මතක සුවඳ

1. පියාණනේ ඔබෙ රුව මට මැවී පෙනෙනවා
ගුරු දිවියේ රස-මුසු තැන් ඔබ පවසනවා
කවට වදන් පුරසාරම් හඬ පැතිරෙනවා
ජීවන තක්සලාවකට අප ගෙන යනවා

2. කිරුළු දැරූ රජකු වගේ හිමිදිරි පින්නේ
නිල්වන් කෙත් යාය බලා ඔබ පිය මැන්නේ
ගත වෙහෙසට ඩා බිඳු මුතු ඇට වැගිරෙන්නේ
සරු අස්වනු නෙළන දට ඔබ හිනැහෙන්නේ

3. දූ-දරුවන් හට තිසි තැන ඔවදන් දුන්නේ
යහ ගුණ දම් මනුසත් කම් විදු නැණ දුන්නේ
සුහද සිතින් ගම්මානෙට සෙත සලසන්නේ
සැම සතහට රජිඳකු වී සිහසුනෙ උන්නේ

4. ගණිත ගැටළු සැනෙකින් ඔබ විසඳලන්නේ
වේවැල රජවී මේසය මත වැඩ ඉන්නේ
සෙනෙහෙ සිතින් දඟ කළවුන් යහ මග යන්නේ
දූ-දරුවන් තැනුවා සිප් කිරි පොවමින්නේ

5. සති අන්තයෙ ගැමියන් හා සුහද සිතින්නේ
කවට වදන් රස මසවුළු බෙද දෙමින්නේ
ගැල් ගිය පටු මග මහ මගකට පෙරලන්නේ
අද වාහන තුරඟුන් නැත ඒ බව දන්නේ

6. ගමේ පන්සලේ වැඩ සිටි බෝ සමිඳුන්නේ
වට පවුරක් තනවා වැලි මලුව සඳන්නේ
වැදි බණ කියමින් කිසිවෙකු නැත රවටන්නේ
මුනිවත රකිමින් දිවිමග දුක දුරලන්නේ

7. මළ හිරු බැස යන යාමේ සතුට බෙදන්නේ
කඩ මන්ඩියෙ පිල උඩ ඉඳ දම් අදින්නේ
විනෝදයෙන් සැහැල්ලුවෙන් දිවි ගෙවමින්නේ
අපහට දුන් ඔවදන් දිවියටම වටින්නේ

8. විවේකයෙන් හාන්සි වී සැනසිලි සුවයෙන්
මිනිබිරි තුරුලට අරගෙන සෙනෙහස පාමින්
ඔබ ගැයූ සුමිහිරි නැලවිලි ගී පද රාවෙන්
මත් මත් වී දෙනුවන් මගෙ බොඳව ගියාදෙන්

9. පුංචි දුවේ යාන්තමට තෙල් ටික ගාපන්
මගේ සපත්තුවේ බකල් එකත් දමාපන්
සුබ නැකතින් දුර ගමනක් යනබව හිතපන්
ඉස්සරහට දුවල ඇවිත් මූන පොවාපන්

10. බාලවියේ සිය දරුවන් තුරුලට අරගෙන
ඉගෙනුම දයාදය බව පසක් කරන මෙන
අනගි රුවන් ඔවදන් දී දරු සිත් සනසන
තම සතු යස ඉසුරු බෙදා දුන්නා සතුටින

11. රෝ දුක් පීඩා කිසිවක් නැත හඳුනන්නේ
තේජවන්ත රජකු වගේ ඔබ වැඩ ඉන්නේ
දෙනෙත් පියා සිටිනාවිට ඔබ දිස් වන්නේ
දිවාරැයේ මගෙ දිවිමග සුවඳ කරන්නේ

12. නිවන් පුරට ගියත් පියේ! අප හැර දලා
නුවන් යොමා සිටිනෙමි මම ඔබ රුව බලලා
දිගන්තයම සුවඳ කරන් ඉඳහිට එබිලා
බලන් යන්න එන්න පියේ හීනෙන් පෙනිලා

පද රචනය :- කල්‍යාණි සෙනරත් යාපා
2005 ජූනි 8